## බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2024.12.18

වේලාව : පෙ.ව.09.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

**මූලාසනය : එස්.එල්.ධම්මිකා කේ.විජයසිංහ මෙනවිය (ප්‍රධාන ලේකම්)**

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

01) කේ.කේ.ජේ.අයි.ඩී.පී.විජයතිලක මයා - ආණ්ඩුකාර ලේකම්(බ.ප)
02) තිලක් සෙනරත් මයා - ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)
03) ඒ.ඩී.එස්.සදීකා මිය - ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය ( බ.ප.)
04) කේ.ඒ.ඩී.ආර්.නිශාන්ති ජයසිංහ මිය - ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ (බ.ප)
05) ඩබ්.ටී.ඒ.මානෙල් මිය - ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශ (බ.ප)/(වැ.බ.)
06) ඩී.එල්.යූ.පීරිස් මිය - ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප.)
07) එල්.ඒ.කළුකපුආරච්චි මයා - ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශ (බ.ප)
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප)(වැ.බ.)
08) බී.එන්.දම්මින්ද කුමාර මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
09) අනුෂා ගෝකුළ ප්‍රනාන්දු මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු)
10) කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
11) කේ.ජී.එච්.සේනක පී සිල්වා මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)(වැ.බ.)
12) පී.පී.විජේවීර මිය - අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන
13) පාලිත අබේවර්ධන මයා - ප්‍රධාන නීති නිලධාරි
14) දිලාන් ප්‍රනාන්දු මයා - සහකාර අධ්‍යක්ෂ(ITRDA wp)
15) එච්.එම්.එච්.කුසුම්සිරි මයා - පරිපාලන නිලධාරි(පාලන)
16) විමුක්ති චාමර මයා - පරිපාලන නිලධාරි(ITRDA wp)

**ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2024.12.18 දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේ දී සාකච්ඡා කල කරුණු හා එළඹි තීරණ පහත පරිදි වේ.**

| අනු අංක | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | 2024 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | පළාත් සංවර්ධන සැලැස්මට අයත් පළාත් අමාත්‍යාංශ මට්ටමින් අනුමත කර ඇති ව්‍යාපෘති පිළිබඳ සාරාංශ විස්තරයක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් ඉදිරිපත් කරන ලද අතර, ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය ප්‍රමාණවත් නොවන බැවින් ඒ සම්බන්ධ අවධානය යොමු කර අවශ්‍ය ඉදිරි කටයුතු මෙහෙයවීමට තීරණය විය. එසේම 2024 වර්ෂයේ ව්‍යාපෘති කටයුතු සිදු කිරීමේ දී වර්ෂාව නිසා වූ බාධාවන් | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| | | හා මැතිවරණ දෙකක් පැවැත්වීම යන කරුණ සලකා ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට ලබා දුන් දිනය වන 2024.12.15 දිනය 2024.12.26 දක්වා දීර්ඝ කිරීම සුදුසු බව තීරණය විය.<br>ඉදිරි වර්ෂයේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා යොමු වන පළාත් සංවර්ධන ප්‍රදාන වලින් සිදු කරන වැඩසටහන් පිළිබඳ ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර තීරණය කිරීම සුදුසු වන බව තීරණය විය. | ආණ්ඩුකාර ලේකම්(බ.ප.)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය/සැලසුම්) |
| 02 | අවිස්සාවේල්ල දිස්ත්‍රික් මහ රෝහලේ අවසන් කර නොමැති ඉදිකිරීම් කටයුතු. | දැනට ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නැවති ඇති මෙම රෝහලේ ඉදිකිරීම් කටයුතු යලි ආරම්භ කිරීම සඳහා **"අවිස්වේල්ල දිස්ත්‍රික් මහ රෝහලේ ඉදිකිරීම් පිළිබඳ ප්‍රධාන ලේකම්ගේ ප්‍රධාන්කවයෙන් යුතු පාලන කමිටුව"** රැස් කර ගතයුතු ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට තීරණය විය. | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප.)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 03 | පළාත් සභාවට අයත් වෙනත් පාර්ශව වෙත තාවකාලිකව පවරා ඇති වාහන පිළිබඳ. | පළාත් සභාවේ අමාත්‍යාංශ වල ගරු අමාත්‍යවරුන් සඳහා වෙන් කර තිබූ හා මේ වන විට ජනාධිපති කාර්යාලය වෙත හා පාර්ලිමේන්තුවේ ගරු අධීක්ෂණ මන්ත්‍රීවරුන් හා වෙත තාවකාලිකව ලබා දී ඇති වාහන වලින් පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.), ප්‍රවාහන අමාත්‍යාංශය (බ.ප.) හා අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප.) වෙත අයත් වාහන තුන (03) පළාත් සභාව වෙත නැවත ලබා දෙන ලෙස 2024.09.25 දිනැතිව ඉල්ලීමක් ජනාධිපති කාර්යාලය වෙත සිදු කරන ලද අතර, ජනාධිපති ලේකම්ගේ අංක PS/IA/TR/E/Vehi/Temp/T.O.III දිනැති ලිපිය මගින් එම රථ වලින් CAT – 3179, CAB – 9442 රථ ජනාධිපති කාර්යාලය සතුව පවතින බවත්, CAD -8773 රථය වැවිලි අමාත්‍යාංශය වෙත තාවකාලිකව අනුයුක්ත කර ඇති බවත් දන්වා ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නැවත වරක් සිහිකැඳවීම් ලිපි යොමු කර ඇත. ප්‍රවාහන හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ද නැවත සිහිකැඳවීම් ලිපි යොමු කර මෙම වාහන පළාත් සභාව වෙත | ලේකම් (පළාත් පාලන/ප්‍රවාහන/අධ්‍යාපන) අමාත්‍යාංශය (බ.ප.)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පාලන/මූල්‍ය) |

| | | | |
|---|---|---|---|
| | | ලබා ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම රථ නැවත ලබා ගැනීම පිළිබඳ අවශ්‍ය කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමටත් තීරණය විය. | |
| 04 | කාර්ය සාධන තරගාවලිය හා වෙබ් අඩවි තරගාවලිය. | කාර්ය සාධන තරගාවලිය සඳහා ආයතන 1018 ක් ලියාපදිංචි වී ඇත.මේ වන විට දෙවන වටයේ අධීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතර,තෙවන හා අවසන් අදියරේ අධීක්ෂණ කටයුතු බාහිර විනිශ්චය මණ්ඩලයක් මඟින් ඉදිරියේ දී සිදු කිරීමට නියමිත වේ.<br>කාර්ය සාධන තරගාවලිය පිළිබඳ ගතයුතු ඉදිරි ක්‍රියා මාර්ග පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වෙනම සාකච්ඡාවක් ලබා ගැනිම සුදුසු වන බව තීරණය විය.<br>හොඳම වෙබ් අඩවිය තේරීමේ තරඟාවලිය සඳහා මේ වන විට ආයතන 39 ක් අයදුම්පත් ඉදිරිපත් කර ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති පාලන චක්‍රලේඛ 05/2024 හි විධි විධාන අනුව ඇගයීම් කටයුතු නියමිත කාල රාමුව අනුව සිදු කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05 | අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සංවිධානය කර ඇති පාසල් වාද්‍ය වෘන්දා තරගාවලිය. | අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සංවිධානය කර ඇති පාසල් වාද්‍ය වෘන්දා තරගාවලියේ ජයග්‍රාහකයින්ට ත්‍යාග ලබා දෙන ආකාරය පිළිබඳ අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය විය. | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය ( බ.ප.) |
| 06 | පළාත් පාලන ආයතනය සහ පළාත් සභාව සතු වන නිරවුල් කර ගත යුතු ඉඩම් පිළිබඳ විස්තර. | පළාත් සභාවට අයත් ඉඩම් පිළිබඳ තොරතුරු පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා ගනිමින් අමාත්‍යාංශ මට්ටමින් රැස් කිරීමට පසුගිය රැස්වීම් වාර වලදී තීරණය කරන ලද පරිදි මේ සම්බන්ධ වාර්තාවක් ඉදිරි ලේකම්වරුන්ගේ රැස්වීමට ඉදිරිපත් කිරීමට තීරණය විය. | ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප.) |

| | | | |
|---|---|---|---|
| 07 | පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම | මේ වන විට ගුරු සේවයේ පුරප්පාඩු 4320 පමණ පවතින බවට පුරෝකථනය කර ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්(බ.ප.) සඳහන් කරන ලද අතර, අධ්‍යාපනවේදී (B. Ed) උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වන ගැසට් නිවේදනය මේ විට නිකුත් කර ඇති බැවින් එම බඳවා ගැනීම් සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය විය.<br><br>සුදුසුකම් සපුරා ඇති ආබාධිත පිරිස් සඳහා ගුරු සේවයේ ලබා දෙන පත්වීම් අනුව ආබාධිත නිලධාරීන් පාසල් පද්ධතිය තුල කටයුතු කිරීමේ දී ඇතිවිය හැකි ප්‍රායෝගික හා ඉදිරියේ දී ඇතිවිය හැකි ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ හා අනෙකුත් ගැටලු සම්බන්ධව පසුගිය ලේකම්වරුන්ගේ රැස්වීමේ දී තීරණය කරන ලද පරිදිම අධ්‍යාපන අමාත්‍යාංශය (රේඛීය) මඟින් සාකච්ඡාවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව තීරණය විය.<br>ඒකඟතාවය පල කර ඇති අන්තර් පළාත් ස්ථාන මාරු සඳහා දැනට පවත්නා පුරප්පාඩු හා පවත්නා ප්‍රතිපත්තිමය විධිවිධාන වලට අනුගත වෙමින් බඳවා ගැනීම් සිදු කිරීම සුදුසු බවට තීරණය විය. | ලේකම්,<br>පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ ( බ.ප.) |
| 08 | බස්නාහිර පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව හා බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ. | බස්නාහිර පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව හා බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පළමු ශ්‍රේණි දෙපාර්තමේන්තු බවට පත් කිරීම සම්බන්ධ ඉදිරි අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) |
| 09 | HRMIS පද්ධතිය පිළිබඳව. | මෙම පද්ධතියේ ඉදිරි කටයුතු සම්බන්ධව හා එහි පවතින දත්ත වල සුරක්ෂිත බව,දත්ත අයිතිය මෙන්ම පැවති නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අදාළ සියලු පාර්ශව කැඳවා සිදු කරන ලබන සාකච්ඡාව 2024.12.18 දින පවත්වා ඉදිරි අවශ්‍ය කටයුතු සිදු කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 10 | පළාත් සභා සංකීර්ණයේ බිම් මහලේ ප්‍රවේශ පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන අලෙවි කුටි. | පළාත් සභා සංකීර්ණයේ බිම් මහලේ ප්‍රවේශ පරිශ්‍රයේ (සොබාදහම් පියස අන්තයේ) පවත්වනු ලබන අලෙවිපොළ නිසාවෙන් සේවයට පැමිණෙන නිලධාරීන්ට බාධාවක් වීම හා පළාත් සභා සේවයේ නියුතු අයවලුන් විධිමත් නොවන ආකාරයට එම කාර්යයන් සඳහා යොමුවීමත් නිරීක්ෂණය වී ඇත. ඒ අනුව සෑම මාසයකම වැටුප් දිනය කේන්ද්‍ර කර ගත් සතියේ වැඩ කරන දින 01 කදී පමණක් (සෑම මාසයකම 26 දින) ප්‍රවේශ පරිශ්‍රයේ පාලන අංශය විසින් වෙන් කර ඇති කොටසේ පමණක් මෙම වෙළඳ කුටි පැවැත්වීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 11 | බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි බඳවා ගැනීම් පිළිබඳ. | බස්නාහිර පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය සඳහා සීමිත පදනම මත බඳවා ගැනීමේ විභාගයේ ප්‍රතිඵල නිකුත් කර බඳවා ගැනීම් කටයුතු සිදු කරමින් පවතී. මෙම බඳවා ගැනීම් සඳහා ගැසට් නිවේදනය ඇතුළත් පුරප්පාඩු ( බඳවා ගැනීමේ නිවේදනය නිකුත් කරන විට පැවති පුරප්පාඩු සංඛ්‍යාව) හා වර්තමානය වන විට සීමිත පදනම යටතේ බඳවා ගැනීම සඳහා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සලකා, තවදුරටත් බඳවා ගත හැකි ප්‍රමාණය මෙම විභාගය සමත් අපේක්ෂකයින් මඟින් පුරවා ගැනිම සුදුසු වන බැවින් ඒ සම්බන්ධ ඉදිරි අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට තීරණය විය. | ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) |
| 12 | බස්නාහිර පළාත් සභා නව ගොඩනැඟිලි සංකීර්ණය හා මොරන්න කළමනාකරණ පුහුණු ආයතනය සඳහා 2025 වර්ෂයේ ආරක්ෂක සේවා සැපයීම හා සනීපාරක්ෂක සේවා සපයා ගැනීම පිළිබඳ. | 2024.12.17 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ දී තීරණය කරන ලද පරිදි ආරක්ෂක සේවාව සහ සනීපාරක්ෂක සේවා සම්බන්ධයෙන් දරනු ලබන පිරිවැයන් සහ මෙම සේවා පවත්වාගෙන යාම සඳහා ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය මඟින් යොදවා ඇති නිලධාරීන් හා සේවකයින් සංඛ්‍යාව සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදු කිරීම හා මෙම සේවා සැපයීම සඳහා වඩා කාර්යක්ෂම ප්‍රවේශය හඳුනා ගැනීම සඳහා පත් කරන ලද කමිටු වාර්තාවේ නිර්දේශ කර ඇති පරිදි, නව කමිටු පත් කර මෙම සේවා ලබා ගැනීම සඳහා | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| | | අවශ්‍ය නව පිරිවිතරයන් සකස් කර දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ විධිමත් ක්‍රමවේදයන් යටතේ අවශ්‍ය සංශෝධන සිදු කර ගැනීමෙන් අනතුරුව, 2025.01.01 දින සිට ක්‍රියාත්මක නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ විවෘත මිල ගණන් කැඳවා කාර්යක්ෂම සේවා සැපයුම් කරුවන් 2025 වර්ෂය සඳහා තොරා ගැනීමටත් ඒ සම්බන්ධ අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා තෙක් 2025 වර්ෂයේ මුල් මාස 03 සඳහා දැනට සේවා සපයන සේවා සැපයුම්කරු වෙතින් පළාත් සභාවේ අවශ්‍යතාවය අනුව සේවා සපයා ගැනීමටත් තීරණය විය. | |
| 13 | නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ | 2025.01.01 දින සිට ක්‍රියාත්මක වන නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු අවස්ථා පළාත් සභාවේ අදාළ නිලධාරීන් වෙත ලබා දීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) |
| | | ඒ අනුව නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් සියලු භාණ්ඩ වැඩ හා සේවා සැපයීම සම්බන්ධ කටයුතු සිදු කිරීමට සියලුම ප්‍රසම්පාදන අංශ හා අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු(බ.ප.) |
| 14 | බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා කලාප කාර්යාලවල ප්‍රසම්පාදන කටයුතු මූල්‍ය අංශය වෙත පැවරීමට කර තිබූ ඉල්ලීම පිළිබඳ | මූල්‍ය චක්‍ර ලේඛ 05/2020 මඟින් පූර්ව ප්‍රසම්පාදන කටයුතු වල සිට ගෙවීම් වව්චර මූල්‍ය අංශයට යොමු කරන තෙක් වන කාර්යය භාරය ප්‍රසම්පාදන අස්තිත්වයේ පාලන අංශයට අයත් කාර්ය භාරය ලෙස පවරා ඇත. එමඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාව තහවුරු කිරීමක් සිදු වන බැවින් ඒ අනුව තවදුරටත් පාලන අංශය මඟින් කටයුතු සිදු කිරීමට තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.) සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| | | බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති සියලුම කාර්යාලවල (අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප කාර්යාලය ඇතුලත් සියලු කාර්යාලවල) ප්‍රසම්පාදන කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ පිහිටුවන ලද විශේෂ ඒකකයක් මඟින් | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප.) |

| | | | |
|---|---|---|---|
| | | සිදු කිරීම සුදුසු වන බවට යෝජනා විය. ඒ අනුව ඒ සම්බන්ධ සුදුසු අවශ්‍ය කටයුතු සිදු කිරීමට තීරණය විය. | |
| 15 | 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතට අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම. | අංක CSWP/ADM/25-14/FI/17(A) හා 2024.10.04/2024.11.12 දිනැති ලිපිය මඟින් දන්වා ඇති පරිදි අ.දූ.චෝ.වි.කො.ස. චක්‍රලේඛ 01/2024 චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2024.09.30 දිනට වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ හා ඉදිරිපත් නොකල තැනැත්තන්ගේ නාම ලේඛන මෙතෙක් ඉදිරිපත් කර නොමැති පහත අමාත්‍යාංශ වල තොරතුරු කඩිනමින් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට තීරණය කරන ලදී.<br>1. අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප.)<br>2. පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප.) | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප.)<br>ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.) |
| 16 | පළාත් සභා කාර්යාල කටයුතු විද්‍යුත් ආකාරයට (e.docs ආකාරයට) පවත්වාගෙන යාම පිළිබඳ. | බස්නාහිර පළාත් සභාවේ කාර්යාල වල දෘඩ පිටපත් සහිත ගොනු නඩත්තු කරනු ලබන අතර, මෙම කටයුතු විද්‍යුත් ආකාරයෙන් සිදු කිරීමේ අවශ්‍යතාවය හා වැදගත්කම සලකා බලා එය ක්‍රියාත්මක කිරීම සඳහා පවත්නා නෛතිකමය අවශ්‍යතාවයන් සහ සීමා, කාර්යාල ක්‍රම හා ඇතුළත් වියයුතු මූලික ක්‍රියාවලි (Process) හඳුනා ගැනීම ඇතුළු අනෙකුත් සියලුම කරුණු පිළිබඳ ඇගයීමක් කර මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිර්ණායක/උපමාන ලබා ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුව 2024.11.20 දින පත් කර ඇත. කමිටු වාර්තාව මෙතෙක් ඉදිරිපත් කර නොමැති බැවින් එම වාර්තාව කඩිනමින් ලබා ගෙන ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 17 | 2025 වර්ෂය සඳහා වන අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලසුම් (Action Plan) ඉදිරිපත් කිරීම. | පළාත් අමාත්‍යාංශ මට්ටමින් ඉදිරි වර්ෂයට අදාළව සකස් කර ඉදිරිපත් කළයුතු ක්‍රියාකාරී සැලසුම් හා ප්‍රසම්පාදන සැලසුම් නිවැරදිව සකස් කර ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයට 2024.12.28 දිනට පෙර යොමු කිරීමට තීරණය විය.<br><br>ඉදිරියේ දී රජය මගින් ඉදිරිපත් කිරීමට නියමිත අතුරු අයවැය අනුව මධ්‍ය රජයෙන් ලැබෙන ව්‍යාපෘති වැඩ (උදා:- මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති) කඩිනමින් සිදු කර අවසන් කිරීම සඳහා පූර්ව සූදානමින් සිටිය යුතු බවට තීරණය විය. | සියලුම අමාත්‍යාංශය ලේකම්වරු(බ.ප.)<br><br>සියලුම නියොජ්‍ය ,ප්‍රධාන ලේකම්වරු |
| 18 | බස්නාහිර පළාත් සභාවේ ආයතන වල නිලධාරීන්ගේ සහභාගීත්වය සහිත නත්තල් කැරොල් වැඩසටහනක් පැවැත්වීම. | බස්නාහිර පළාත් සභාවේ ආයතන වල නිලධාරීන්ගේ සහභාගීත්වය සහිත නත්තල් කැරොල් වැඩසටහන 2024.12.27 දින පැවැත්වීමට තීරණය විය. | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප.) |
| 19 | නත්තල් උත්සවය වෙනුවෙන් පළාත් සභා ගොඩනැඟිල්ල විදුලි ආලෝකකරණය කිරීම. | එළඹෙන නත්තල් සමය වෙනුවෙන් නව පළාත් සභා ගොඩනැඟිල්ල විදුලි බල්බ වලින් වර්ණවත්ව ආලෝකකරණය කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) |

වාර්තා කලේ : එච්.එම්.එච්.කුසුම්සිරි
පරිපාලන නිලධාරි (පාලන)

.............................................

එස්.එල්.ධම්මිකා කේ.විජයසිංහ,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

දිනය: 2024.12.26